**පොල් වගාකිරීමේ මණ්ඩලය - 2023**

**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පොල් වගාකිරීමේ මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ , 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව

හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 48 ඡේදය අනුව අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් එකිනෙකට හිලව් නොකළ යුතු වුවද රු. 21,193,131 ක කෙටිකාලීන වෙන්කිරීම් ශේෂය තුළ රු.14,485,699 ක හර ශේෂයක්ද ඇතුළත් වී තිබීම නිසා කෙටිකාලීන වෙන් කිරීම් ශේෂය රු.14,485,699 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේ ප්‍රධාන කාර්යාලයේ ඉදිකිරීම් 2023 වර්ෂය අවසානයේ ගිවිසුම්ගත වී ඇති බවත්, ඒ අනුව 2023 වර්ෂයේ අත්තිකාරම් ගෙවීම් සිදු කර ඇති බවත්. අදාළ කාර්යය වෙනුවෙන් 2023.12.27 දින රු.මි.6,436,450.44 ක වටිනාකම ඇති ද්‍රව්‍ය වැඩබිමෙහි තිබූ බවට උපදේශන ආයතනය විසින් දන්වා තිබුණි. ඒ අනුව ඉදිකිරීම් ප්‍රගතියක් තිබූ බැවින්, 2023 වර්ෂයේ ප්‍රතිපාදන තුළින් ගෙවීම් සඳහා වෙන්කිරීම් සිදු කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව වත්කම් හා වගකීම් එකිනෙකට හිලව් නොකළ යුතුය. |
| (ආ) ඇප ආවරණ ගිවිසුමෙහි 7.0 ප්‍රකාරව නිරවුල් නොවන ණය ගණයට මාරු වී තිබූ රු. 2,403,672 ක ණය ශේෂයක් වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දින වන විට රු.1,201,701 ක ඇප ආවරණ ගෙවීමක් මණ්ඩලය විසින් සිදුකර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් නීතිමය කටයුත්තක් ක්‍රියාත්මක වෙමින් පැවතියද එය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 08 ප්‍රකාරව අසම්භාව්‍ය වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි. | 2024 වර්ෂයේ ගිණුම්කරණ සටහන් තුළ නිරවුල් නොවූ ණය සම්බන්ධව නීතිමය කටයුතුවල වර්තමාන තත්ත්වය හෙළිදරව් කිරීමට කටයුතු කර ඇත. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව අසම්භාව්‍ය වත්කම් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)සමාලෝචිත වර්ෂය තුළදී ආයතන හතරකින් ප්‍රවාහන ගාස්තු හා බෑමේ කුලීද සහිතව රු.51,024,030 ක වටිනාකමකට මිලදීගත් පොහොර තොගයක් 2023 දෙසැම්බර් 31 දිනට මහයාය ආදර්ශ පොල් උයනේ ගබඩා කර තිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල පොහොර තොගයේ පිරිවැය ලෙසරු.50,073,908 ක් පොහොර තොග ගිණුමටද ප්‍රවාහන වියදම් රු.777,942 ක් විවිධ වියදම් ලෙසද බෑමේ ගාස්තු රු.172,180 ආදර්ශ පොල් උයන් වියදම් ලෙසද ගිණුම් ගතකර තිබුණි .මේ හේතුවෙන් අවසන් පොහොර තොගයේ වටිනාකම රු.950.122 ක් අඩුවෙන්ද, විවිධ වියදම් රු.777,942 ක් වැඩියෙන්ද තවාන් වියදම් රු.172,180 ක් වැඩියෙන් ද ගිණුම්වල දක්වා තිබුණි. | මෙම පොහොර තොගය බෙදාහැරීම සිදුකර ඇත්තේ 2024 වර්ෂය තුළදීය. එහිදී නිසි ආකාරයට තොග ගණනය කර බෙදාහැර ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ඇත. | අවසන් තොගයේ වටිනාකම, විවිධ වියදම් හා තවාන් වියදම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ආයතන 4 කට අදාළව රු. 209,526,817 ක් වූ ප්‍රතිමූල්‍ය ණය ශේෂය මත එම මූල්‍ය ආයතන විසින් ඇප ආවරණ අරමුදල වෙත තැන්පත් කළ යුතු සියයට 0.5 ක වටිනාකම වන රු. 1,047,634 ක් වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දින වන විටත් රු. 916,588 ක් බැංකු ගිණුම් තුළ තැන්පත් කර නොතිබුණි. එබැවින් ලැබිය යුතු ඇප ආවරණ හා ඇප ආවරණ අරමුදල රු. 916,588 කින් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | කප්රුක ආයෝජන ණය යෝජනා ක්‍රමයේ ගිණුම් කටයුතු මුදල් පදනම මත දිගු කාලිනව පවත්වාගෙන ගොස් ඇති අතර ඒ අනුව 2023 වර්ෂයට ගිණුම් තැබීම සිදුකර ඇති බැවින් මෙම වෙනස ජනිත වී ඇත. | ලැබිය යුතු ඇප ආවරණ හා ඇප ආවරණ අරමුදල් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඇ) ප්‍රධාන කාර්යාලය සඳහා කොටසක් ඉදිකිරීමට අදාළව පැරණි කොන්ත්‍රාත් ගිවිසුම කඩ කිරීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු සමඟ පවතින නීතිමය ගැටළු නිරාකරණයට අදාළව දරන ලද රු.255,500 ක් වියදම් ලෙස හඳුනා නොගෙන නොනිමි වැඩ ලෙස හඳුනා ගෙන තිබුණි. | ප්‍රධාන කාර්යාලය සඳහා කොටසක් ඉදිකිරීමට අදාළව පවතින නීතිමය ගැටලු නිරාකරණය සඳහා දරන ලද රු.255,500 ක මුදල නොනිමි වැඩ ලෙස ප්‍රමිතිය අනුව හඳුනාගෙන ඇත. | කොන්ත්‍රාත්තුවලට අදාළ වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ප්‍රධාන කාර්යාලයට නව කොටසක් එක් කිරීමට අදාළ කොන්ත්‍රාත්තුව සඳහා ගෙවන ලද රු.1,551,345 ක අත්තිකාරම් මුදල අත්තිකාරම් ලෙස හඳුනා නොගෙන නොනිමි වැඩ ලෙස ගිණුම්ගත වී තිබුණි. | ප්‍රධාන කාර්යාලයේ නව කොටසක් එක් කිරීමට අදාළ වානේ ව්‍යුහමය කොටස අවසන් කිරීමේ කොන්ත්‍රාත්තුවේ ගෙවන ලද අත්තිකාරම් මුදල රු.1,551,345 ක නොනිමි වැඩ ගිණුමට ගිණුම්ගත කර ඇති මුත් මෙමගින් සමස්ථ මූල්‍ය ප්‍රකාශනයේ අගයට බලපෑමක් සිදු වී නොමැත. | කොන්ත්‍රාත්කරු වෙත ගෙවන ලද අත්තිකාරම් නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ඉ) බත්තුළු ඔය පොල් සංවර්ධන නිලධාරී නිල නිවාස භූමියේ වැට අළුත්වැඩියාව ඇතුළු නිල නිවාසය අළුත්වැඩියාව නිමකර තිබුණද ඒ වෙනුවෙන් මාරවිල ප්‍රාදේශීය කාර්යාලය වෙත ලබා දුන් රු.1,531,659 ක අත්තිකාරම, අත්තිකාරම් ගිණුම බැර කර අළුත්වැඩියා වියදම ලෙස ගිණුම් ගතකර නොතිබුණි. | මෙම වියදම් දරා ඇත්තේ අලුත්වැඩියා කටයුතු හා එම වත්කම් වල නඩත්තුවට බැවින් එහිදි වත්කමෙහි ප්‍රාග්ධන ස්වරූපයේ අගය වැඩිවීමක් සිදු නොවී ඇත. | අලුත්වැඩියා වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රතිමූල්‍ය ණය ශේෂය ලෙස ජංගම වත්කම් තුළ දක්වා තිබුණු රු.560,716,597 ක වටිනාකම මූල්‍ය ආයතන ශේෂ සනාථන අනුව ශේෂය වන අතර 2023 දෙසැම්බර් මාසයට අදාළව මූල්‍ය ආයතන වෙත මණ්ඩලය විසින් ප්‍රතිමූල්‍යනය කර ඇති රු.12,338,000 ක වටිනාකම එම ණය ශේෂය තුළ අන්තර්ගත නොවීම හේතුවෙන් ප්‍රතිමූල්‍ය ණය ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | කප්රුක ආයෝජන ණය යෝජනා ක්‍රමයේ ගිණුම් කටයුතු මුදල් පදනම මත දිගු කාලීනව පවත්වාගෙන ගොස් ඇති අතර ඒ අනුව 2023 වර්ෂයට ගිණුම් තැබීම සිදු කර ඇති බැවින් මෙම වෙනස ජනිත වී ඇත. | මණ්ඩලය විසින් නිකුත් කර තිබුණු මුළු ප්‍රතිමූල්‍ය ණය ශේෂය නිවැරදිව ගිණුම් ගතකළ යුතුය. |
| (උ) 2023 දෙසැම්බර් 31 දිනට මහජන බැංකුවට අදාළව බැංකුව විසින් එවූ ශේෂ සනාථන ලිපිය අනුව ප්‍රතිමූල්‍ය ණය ශේෂය රු.82,086,935 ක් වූ අතර මණ්ඩලයේ ලෙජරය අනුව මෙම ශේෂය රු.81,089,716 ක් වුවද මෙම වෙනස පිළිබඳ සොයා බලා නිරවුල් කරගෙන නොතිබුණි. | 2024 වර්ෂයේදී අවසාන ගිණුම් තුළ එහි වර්තමාන තත්ත්වය හෙළිදරව් කිරීමට කටයුතු කරනු ඇත. | ප්‍රති මූල්‍ය ණය ශේෂය අදාළ බැංකු සනාථන අනුව සැසඳීම් කර නිවැරදි අගය ගිණුම් ගත කළ යුතුය. |
| (ඌ) 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සටහන් තුළ දක්වා ඇති පොල් වගා කිරීමේ මණ්ඩලයට අයත් කුලියාපිටිය, කෑගල්ල, කළුතර, මාතර, මාතලේ ප්‍රාදේශීය කාර්යාල හා නිල නිවාස ඉදිකර ඇති අක්කර 2 රූඩ් 1 පර්චස් 34.4 ක ඉඩම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | පොල් වගාකිරීමේ මණ්ඩලයට අයත් කුලියාපිටිය, කෑගල්ල, කළුතර, මාතර හා මාතලේ ප්‍රාදේශීය කාර්යාල හා නිල නිවාසවල ප්‍රත්‍යාගණනය කිරීමේ කටයුතු අවසන් වූ පසු ගිණුම්ගත කිරීම සිදු කරනු ඇත. | මණ්ඩලයට අයත් ඉඩම් තක්සේරු කර සාධාරණ අගය ගිණුම් ගතකළ යුතුය. |

| | | |
|---|---|---|
| (එ) 2022 වර්ෂයට අදාළ රු.2,971,759 ක රඳවාගැනීම් බදු මුදල සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම් ගත වීම නිසා එම වටිනාකමින් ඌණතාවය අධිගණනය වී තිබුණි. | මෙම රඳවා ගැනීමේ බදු 2022 වර්ෂයට අදාළ වුවද බදු හඳුනාගෙන ඇත්තේ 2023 වර්ෂය තුළදීය. මේ හේතුවෙන් වසරේ බදු වියදමක් ලෙස සලකා ගිණුම්ගත කර ඇත. මෙහිදී පසුගිය වර්ෂයේ අතිරික්තයට ගැලපීම් සිදු කළ යුතු වුවද ප්‍රවර්ථන වර්ෂයේ ලාභය සඳහා ගැලපීම් සිදු කොට ඇත. | සමාලෝචිත වර්ෂයට අදාළ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගතකළ යුතුය. |
| (ඒ) 2022 වර්ෂයේ ලැබිය යුතු පොල් පැළ ප්‍රවාහන දීමනාව වූ රු.48,888,000 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි. | 2022 වර්ෂයේ පොල් පැළ ප්‍රවාහනය වෙනුවෙන් ලැබිය යුතු රු.48,888,000 ක වටිනාකම සඳහා 2023 වර්ෂයේදී ගෙවා තිබුණි. 2023 සමාලෝචිත වර්ෂයේදී එම මුදල ආදායම් හා වියදම් වශයෙන් ගිණුම්ගත කර ඇත. | සමාලෝචිත වර්ෂයේදී ලැබුණු පසුගිය වර්ෂයට අදාළ ලැබිය යුතු ප්‍රවාහන දීමනා නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඔ) කිසිදු ඉදිකිරීමක් සිදු නොකර 2023 වර්ෂයේදී ප්‍රධාන කාර්යාලයේ ඉදිරිපස කොටසට වානේ ව්‍යුහමය කොටසක් එකතු කිරීම වෙනුවෙන් වූ රු.10,679,161 ක ඇස්තමේන්තු මුදල කොන්ත්‍රාත් සඳහා වෙන්කිරීමේ ගිණුම හරකර කොන්ත්‍රාත් ණයහිමි ගිණුමට බැර කර තිබුණි. | 2023 වර්ෂයේ අත්තිකාරම් ගෙවීම් සිදුකර ඇති බවත්, අදාළ කාර්යය වෙනුවෙන් 2023.12.27 දින රු.මි.6,436,450 ක වටිනාකම ඇති ද්‍රව්‍ය වැඩ බිමෙහි තිබූ බවට උපදේශන ආයතනය විසින් දන්වා තිබුණි. ඒ අනුව ඉදිකිරීම් ප්‍රගතියක් තිබූ බැවින්, 2023 වර්ෂයේ ප්‍රතිපාදන තුළින් ගෙවීම් සඳහා වෙන්කිරීම් සිදුකර ඇත. | වෙන්කිරීම් නිවැරදිව ගිණුම් ගතකළ යුතුය. |
| (ඕ) 2023 වර්ෂයේදී මීගමුව බීජ නිෂ්පාදන ඒකකයේ නවීකරණ කටයුතු වෙනුවෙන් වෙන්කර තිබූ රු.3,806,538 ක ඇස්තමේන්තු මුදල කොන්ත්‍රාත් සඳහා වෙන්කිරීම් ගිණුමට හර කර කොන්ත්‍රාත් ණයහිමි ගිණුමට බැරකර තිබුණි. | 2023 වර්ෂයේදී බීජ නිෂ්පාදන ඒකකයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සිදුකර ඇති අතර ඒ අනුව ඒ වෙනුවෙන් දැරිය යුතු රු.3,806,538 ක මුදල කොන්ත්‍රාත් සඳහා වෙන්කිරීමේ ගිණුමට හරකර ගිණුම්ගත කර ඇත. | වෙන්කිරීම් නිවැරදිව ගිණුම් ගතකළ යුතුය. |
| (ක) 2023 වර්ෂය තුළ ගෙවන ලද 2021 හා 2022 වර්ෂයන්ට අදාළ රු.7,830,263 ක සභාපති වැටුප් හා දීමනා සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගතකර තිබුණි. | 2022 වර්ෂයේ අයවැය සකස් කිරීමේදී හිටපු සභාපති දීමනාව සඳහා වන රු.7,830,263ක මුදල ප්‍රතිපාදන වෙන්කර නොතිබූ බැවින් එම මුදල වෙන්කිරීමට හැකියාවක් නොමැත. | පසුගිය වර්ෂයන්ට අදාළ වැටුප් හා දීමනා නිවැරදිව ගිණුම් ගතකළ යුතුය. |
| (ග) 2023 වර්ෂයට අදාළව භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන රු.34,264,979 ක මුදල සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත නොකර දායකත්ව ප්‍රාග්ධන ප්‍රදාන අරමුදලට බැර කර තිබුණි. | 2023 වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන තුළින් එම වර්ෂය තුළදී ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම හා ඉදිකිරීම් සඳහා දරන ලද රු.34,264,979 ක මුදල ආදායම් වශයෙන් ගිණුම්ගත කිරීමෙන් මණ්ඩලයේ සමස්ථ ලාභයට බලපාන බැවින් ආදායම් වශයෙන් ගිණුම් ගතකර නොමැත. | සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලැබී වියදම් කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන වර්ෂයේ ආදායමට හඳුනා ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ච) වැව්ලි අමාත්‍යාංශයෙන් 2022 වර්ෂයට අදාළව ලැබිය යුතු රු.207,660,000 ක වටිනාකම ලැබිය යුතු ගිණුමකට හර කර තිබූ අතර එම ලැබිය යුතු මුදලෙන් රු.153,430,000 ක් වූ ලැබීම සමාලෝචිත වර්ෂයේදී ද ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි. එම ලැබූ වටිනාකම වෙනුවට රු.201,195,000 ක මුදලක් තවත් වියදම් ගිණුම හරකර ලැබිය යුතු අමාත්‍යාංශ අරමුදල් ගිණුම බැරකර තිබුණි. මේ හේතුවෙන් ලැබිය යුතු අමාත්‍යාංශ අරමුදල් ගිණුම රු.47,765,000 ක් අඩුවෙන්ද එම ප්‍රමාණයෙන් අලාභය වැඩියෙන්ද දක්වා තිබුණි. | 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වලින් අමාත්‍යාංශය මඟින් ලැබිය යුතුව තිබූ මුදල රු.මිලියන 48.8 ක් බව දන්වා සිටිමි. එමෙන්ම රු.256,548,000 ක් ලැබිය යුතු වුවද රු.202,310,000 ක් ලෙස ගිණුම්ගත කරන ලද්දේ 2023 වර්ෂයේ ලද ප්‍රතිපාදන තුළින්, එම වර්ෂය තුළ අනිවාර්යයෙන්ම සිදුකළ යුතු සංවර්ධන කාර්යයන් වෙන් කිරීමෙන් පසු 2022 වර්ෂයේ ගෙවීම් වෙනුවෙන් වෙන්කළ හැකිව තිබූ ප්‍රමාණය බැවින් එම මුදල සඳහා වෙන් කිරීම් කර ඇත. | 2023 වර්ෂයේදී ලැබුණු 2022 වර්ෂයට අදාළ ලැබිය යුතු ශේෂයන් නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ජ)කප්රුක ආයෝජන ණය යෝජනා ක්‍රමයට අදාළව සමාලෝචිත වර්ෂය තුළදී මුළු පොළී සහන ගෙවීම් ලෙස රු.16,870,720 ක් ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂයට අදාළ පොළී සහන වියදම රු.427,607 ක් වූයෙන් පොළී සහන වියදම රු.16,443,113 ක් වැඩියෙන් ගිණුම් ගත වී තිබුණි. | කප්රුක පොළී සහන ගෙවීම වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ඇතුළත් සංවර්ධන වැඩසටහන් තුළ වෙන්කල ප්‍රතිපාදන මඟින් සිදුකර ඇති බැවින් හා පොළී සහන ලබාදීම ණය නිකුත් කළ වර්ෂය තුළදීම සිදු නොකිරීම, එසේම පොළී සහන ලබාදීම වසර කිහිපයක් සිදුකරන බැවින් පොළී සහන ගෙවීමේ වසර පදනම් කරගෙන සිදු කර ඇති බැවින් වසරේ සංවර්ධන වියදමක් ලෙස ගිණුම්ගත කොට ඇත. | පොළී සහන වියදම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන තුළ දැක්විය යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සේවකයන් 04 දෙනෙකු වෙත ලබා දී තිබූ එකතුව රු.25,000 ක් වූ උත්සව අත්තිකාරම් ශේෂයන් හා සේවය හැර ගිය 35 දෙනෙකුගෙන් අයවිය යුතු රු.2,539,424 ක් අවුරුදු 1 සිට අවුරුදු 5 ට වැඩි කාලයක සිට හිඟව පවතින අතර සේවකයන් 5 ක් වෙත ලබා දී තිබූ එකතුව රු.314,807 ක් වූ ආපදා ණය මුදල් වර්ෂ 5 කට වඩා අධික කාලයක සිට හිඟව පැවති අතර එම ණය අයකර ගැනීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි. | උත්සව අත්තිකාරම්, ආපදා ණය හා මණ්ඩලයේ සේවකයන් වෙත ලබා දී ඇති ණය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයකරගෙන නොමැත. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ආ)වසර 5 කට වඩා වැඩි කාලයක් ඉකුත් වූ රු.2,510,599 ක් වූ ආයතන 5 ක ණයගැති ශේෂ 5 ක් තවදුරටත් අයනොවී | සමාගම් 2 ක් සම්බන්ධයෙන් නීති උපදෙස් ලබාගන්නා අතර එක් වැවිලි සමාගමකින් හා අමාත්‍යාංශ සුභසාධකයෙන් අයවිය යුතු | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| පැවති අතර එකී ආයතන 2 ක් සඳහා නඩු පවරා තිබූ බවද නිරීක්ෂණය විය. | ශේෂ තහවුරු කරගෙන නොමැත. | |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)2023 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ රඳවාගත් මුදල් වටිනාකම රු.4,675,343 ක් වූ අතර ඉන් ඉදිකිරීම් කාර්යයන් 20 ක් සඳහා රු.4,126,231 ක රැඳවුම් මුදල් වසර 2 ත් 5 ත් අතර කාලයක් රඳවාගෙන තිබුණු අතර මෙම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම කොන්ත්‍රාත්වලින් රු.353,776 ක් වටිනා ඉදිකිරීම් නිමකර නොමැති අතර අනිකුත් ඉදිකිරීම් ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් තහවුරු කරගෙන 2024 වර්ෂයේ ගිණුම් තුළින් ගැලපීමට කටයුතු කරනු ඇත. | රැඳවුම් මුදල් මඟින් ඉදිකිරීම් වලට අදාළ අඩුපාඩු සකස් කරගැනීමට කටයුතු කළ යුතු අතර දිගුකාලීන රැඳවුම් මුදල් ආදායමට ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) කොන්ත්‍රාත් ණයහිමියන් තිදෙනෙකුට අදාළව ගෙවිය යුතු රු.9,953,713ක මුදලක් වසර 3 ත් 4 ත් අතර කාලයක සිට නිරවුල් නොවී පැවතුණි. | මෙම කොන්ත්‍රාත් ගෙවීම් ප්‍රාදේශීය කාර්යාල තුළින් තහවුරු කරගෙන පියවීමට කටයුතු කරනු ඇත. | ඉදිකිරීම් කාර්යයන්ට අදාළ ගනුදෙනු නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.7 නීති, රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2020 ජනවාරි 27 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2020 හි 02 වගන්තිය, රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 1/2015 හි 2.3 ඡේදය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2023 මාර්තු 20 දිනැති අංක PED/P/02/15 (i) temp 3 දරන ලිපිය | පොල් වගා කිරීමේ මණ්ඩලය සඳහා අනුමත කාර්යමණ්ඩලයට ඇතුළත් නොවූ ක්‍රියාකාරී අධ්‍යක්ෂකවරයෙකු සඳහා රු.59,650 ක මාසික දීමනාවක් සමඟ වෙන්කල වාහනයක් හා මසකට ඉන්ධන ලීටර් 115 ක් ලබා දී තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ මාසික දීමනාව, ඉන්ධන දීමනාව, අනුයුක්ත කළ රියදුරු අතිකාල හා සංයුක්ත දීමනා ලෙස රු1,684,942 ක් ගෙවා තිබුණි. | පොල් සංවර්ධන පනතේ 2A යටතේ පොල් වගාකිරීමේ මණ්ඩලය වෙත ක්‍රියාකාරී අධ්‍යක්ෂක ධූරය සඳහා පත්කිරීමක් සිදුකර ඇත. මෙම තනතුර සඳහා පත්කිරීමේ බලය සංශෝධිත පොල් සංවර්ධන ආඥා පනතෙහි 10.2 (ixඅ) වගන්තිය පරිදි වේ. රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 03/2015 හි 2 වන වගන්ති ප්‍රකාරව මාසික දීමනාවක්ද, රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2015 සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 හා 1999.10.08 හි 1:1:6 (iii) උප වගන්තිය අනුව නිල වාහනයක් අනුයුක්ත කිරීමේ හැකියාවක් පවතින බැවින් අදාළ පත්කිරීම, දීමනා සහ නිල වාහනයක් ලබාදීම අමාත්‍යාංශයේ මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් ප්‍රකාරව සිදුකර ඇත. | යොමුගත චක්‍රලේඛ හා ලිපි අනුව අනුමත නොවූ ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුර සඳහා පත්කිරීම් නොකළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 62,743,429 ක ඌණතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපී ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 389,622,417 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 452,365,846 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශ ලැබීම් හා වෙනත් ආදායම් පිළිවෙලින් රු.84,197,714 කින් හා රු.312,869,734 කින් අඩුවීමත් විශේෂ ව්‍යාපෘති වියදම් හා තවාන් වියදම් පිළිවෙලින් රු.114,444,834 කින් හා රු.230,941,832 කින් වැඩි වීමත් මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත පරිදි වේ.

| විෂයය | 2023 වර්ෂය රු. | 2022 වර්ෂය රු. | විචලනය රු. | විචලනය ප්‍රතිශතයක් ලෙස සියයට |
|---|---|---|---|---|
| **ආදායම්** | | | | |
| භාණ්ඩාගාර ලැබීම් | 975,528,021 | 622,520,000 | 353,008,021 | 57 |
| අමාත්‍යාංශ ලැබීම් | 134,226,286 | 218,424,000 | 84,197,714 | 39 |
| වෙනත් ආදායම් | 1,416,685,109 | 1,729,554,843 | 312,869,734 | 18 |
| **වියදම්** | | | | |
| විශේෂ ව්‍යාපෘති වියදම් | 114,444,834 | - | 114,444,834 | 100 |
| වැටුප් හා දීමනා | 456,066,871 | 396,829,213 | 59,237,658 | 15 |
| තවාන් වියදම් | 959,949,795 | 729,007,963 | 230,941,832 | 32 |
| ක්ෂය හා ක්‍රම ක්ෂය වියදම් | 82,647,065 | 55,517,342 | 27,129,723 | 49 |
| කප්රුක ආයෝජන අරමුදල් වියදම් | 28,054,451 | 18,622,731 | 9,431,720 | 51 |
| වෙනත් වියදම් | 119,910,849 | 194,108,817 | 74,197,968 | 38 |

### 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම හා ක්ෂණික වත්කම් අනුපාතයන් 7 : 1 ක් හා 5 : 1 ක් වූ අතර පසුගිය වර්ෂයේදී එම අනුපාතයන් පිළිවෙලින් 11 : 1 ක් හා 7 : 1 ක් විය. 2022 හා 2023 වර්ෂයන්හි තොගය පිළිවෙලින් රු.902,523,566 ක් හා රු.514,593,147 ක් ද කෙටිකාලීන ආයෝජන පිළිවෙලින් රු.713,680,908 ක් හා රු.904,068,523 ක්ද වීම ජංගම හා ක්ෂණික වත්කම් ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව ආරම්භ කළ පොල් පැළ මිලියන 7.5 ක නිෂ්පාදන | පොල් වගාකිරීමේ මණ්ඩලය වෙත මහා භාණ්ඩාගාරය මඟින් ප්‍රතිපාදන ලබාදීම සිදුකරනු ලබන්නේ ස්ථිර කාර්යය මණ්ඩල | පොල් පැළ ව්‍යාපෘතියෙන් ලද ආදායම භාණ්ඩාගාරය වෙත යැවීමට කටයුතු කළ |

| | | |
|---|---|---|
| ව්‍යාපෘතියක් වෙනුවෙන් මණ්ඩලය විසින් දරන ලද වියදම භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූරණය කරගෙන තිබුණද මෙම ව්‍යාපෘතියෙන් නිෂ්පාදනය කළ පොල් පැළ විකුණා ලද ආදායම වූ රු. 814,263,729 ක් මහා භාණ්ඩාගාරය වෙත නොයවා මණ්ඩලයේ ආදායම ලෙස ගිණුම් ගතකර තිබුණි. | වැටුප් හා සංවර්ධන වැඩසටහන් සඳහා පමණි. මෙහිදී පොල් වගාකිරීමේ මණ්ඩලයේ අනියම් සහ චෙක්රෝල් සේවක වැටුප් මෙන්ම ස්වයං මූල්‍ය ඒකකය යටතේ බඳවාගෙන ඇති ස්ථිර කාර්යය මණ්ඩලය සඳහා වැටුප්ද සියලුම පුනරාවර්තන සඳහා ප්‍රතිපාදන ලබාගනු ලබන්නේ ස්වයං මූල්‍ය ඒකක ප්‍රතිපාදන මඟිනි. එහිදී ස්වයං මූල්‍ය ඒකකයෙන් මහා භාණ්ඩාගාරය වෙත යොමු කිරීම සඳහා ප්‍රමාණවත් අතිරික්තයක් නොමැත. | යුතුය. |
| (ආ)පොල් පර්යේෂණ මණ්ඩලය විසින් පොල් පැළ සිටුවීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති තාක්ෂණික උපදෙස් පත්‍රිකා A 3 හි සඳහන් ආකාරයට ඵලදායී පොල් වගාවක් සඳහා නිර්දේශ කර ඇති CRIC 68, CRIC 65, CRISL 98, කප්රුවන, කප්සුවය. කප්සෙත, මොරොක් උස හා උසස් ශාක (PP) යන පොල් ප්‍රභේද තෝරා ගැනීම සිදුකළ යුතු වුවද පොල් පැළ මිලියන 7.5 ක නිපදවීමේ ව්‍යාපෘතිය සඳහා එම නිර්දේශවලට පටහැනිව PP2 වර්ගයේ බීජ පොල් 2.602,012 ක ප්‍රමාණයක් පෞද්ගලික වතුවලින් මිලදීගෙන තිබුණි. | පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශිත බීජ පොල් වලින් මණ්ඩලය වෙත ලබාදෙනුයේ CRIC 60 සහ CRIC 65 සීමිත බීජ පොල් ප්‍රමාණයක් වේ. එසේම පොල් වගාකිරීමේ මණ්ඩලයේ ආදර්ශ පොල් උයන්වලින් හා වෙනත් තෝරා ගත් බීජ පොල් වතුවලින් යම් බීජ පොල් ප්‍රමාණයක් ලබා ගනී. තවද, පොල් පැළ මිලියන 7.5 ක ඉලක්කයක් ලබා ගැනීම සඳහා මෙම බීජ පොල් ප්‍රමාණය ප්‍රමාණවත් නොවන හෙයින් බිජ නිෂ්පාදන ඒකකයේ හා පොල් පර්යේෂණ ආයතනයේ සහාය ඇතිව බීජ මව් ගස් තෝරා තත්ත්වයෙන් උසස් ගුණාත්මක බීජ පොල් (PP සහ PP2) පෞද්ගලික වතුවලින් ලබාගැනීම කටයුතු කර 7.5 ක බීජ පොල් ඉලක්කය සපුරා ගැනීම සිදුකර ඇත. | පොල් පර්යේෂණ මණ්ඩලය විසින් ඵලදායී පොල් වගාවක් සඳහා නිකුත් කර ඇති උපදෙස් පත්‍රිකා අනුව නිර්දේශිත බිජ පොල් මිලදී ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ)පොල් පර්යේෂණ ආයතන විසින් නිකුත් කර ඇති තාක්ෂණික උපදෙස් පත්‍රිකා A2 අනුව මනාව වැඩුණු වයස මාස 7 -10 පමණ වූ ක්‍රමානුකූලව තෝරාගත් පොල් පැළ පමණක් ක්ෂේත්‍රයේ සිටුවිය යුතු වුවද 2022 දෙසැම්බර් 13 දිනැති අමප/22/1942/616/023 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව පොල් වගාකිරීමේ මණ්ඩලය විසින් නිෂ්පාදිත මාස 10 ඉක්මවූ අධිවර්ධිත පොල් පැළ 446,407 ක් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු මඟින් ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ ගෙවතු වගා වැඩසටහන යටතේ නොමිලේ බෙදාහැර තිබුණි. එසේම මාස 10 ඉක්මවූ අධිවර්ධිත පැළ 466,926 ක් උතුරු පොල් ව්‍යාපෘතිය වෙතද එම පැළ 652,359 ක් කප්රුක පුරවර සමිති හරහාද නොමිලේ බෙදාහැර තිබුණි. | පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශිත වයස ඉක්මවූ පැළ යම් ප්‍රමාණයක් පොල් වගාකිරීමේ මණ්ඩලයේ තවාන් වල වර්ධනය වෙමින් පැවතුනි. මෙම පැල තවදුරටත් කාලයක් සමඟ වර්ධනය වීමට ඉඩ සැලැස්වීම එවා සම්පූර්ණයෙන් කපා ඉවත් කිරීමට සිදුවන නිසා මාස 10 ඉක්මවූවත් වගාකිරීමට සුදුසු පැළ නොමිලේ ලබාදීමට පොල් වගාකිරීමේ මණ්ඩලය තීරණය කරන ලදි. මෙවැනි පැළ ක්ෂේත්‍රයේ සිටුවූවිට පසුකාලීන නඩත්තු කළහොත් පසුකාලීනව හොඳ පොල් ගසක් තත්ත්වය පත්වීමට හැකියාව පවතින බැවින් ජාතික ධනය විනාශ වීම වළක්වාලීම සඳහා නිෂ්පාදනය කරනු ලැබූ පැළ වලින් උපරිම ප්‍රයෝජනයක් ලබාගැනීමට මෙම පියවර ගෙන ඇත. | නිසි අධ්‍යනයකින් හා සැලැස්මකින් යුතුව ව්‍යාපෘති ආරම්භ කළයුතු අතර පොල් පර්යේෂණ ආයතනයේ තාක්ෂණික උපදෙස් අනුව ක්‍රමානුකූලව වැඩුණු පොල් පැළ පමණක් ක්ෂේත්‍රයේ සිටුවීමට නිකුත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ)අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අමාත්‍යාංශය වෙත වෙන්කර ඇති ප්‍රතිපාදන හා මණ්ඩලයේ අරමුදල් කළමනාකරණය කරගනිමින් පොල් පැළ ප්‍රවාහන හා පරිපාලන වියදම් දැරිය යුතු වුවත් නිකුත් කළ අධිවර්ධිත පැළ 446,407 ක ප්‍රමාණය සඳහා පැළ ප්‍රවාහන පිරිවැය ලෙස රු.මිලියන 40 ක් ද පරිපාලන වියදම් ලෙස රු.මිලියන 8.88 ක් ද ලෙස රු.මිලියන 48.88 ක් ද 2023 වර්ෂයේදි ප්‍රාග්ධන ප්‍රදාන ලෙස භාණ්ඩාගාරයෙන් ලබාගෙන තිබුණි. මේ අනුව නොමිලේ බෙදාහරින ලද අධිවර්ධිත එක් පොල් පැළයකට ප්‍රවාහන හා පරිපාලන වියදම් ලෙස රු.110 ක් වැය වී තිබුණි. | අපේක්ෂා කරනු ලැබූ ආයතනයන් පැළ නොගන්නා නිසා එම පැළ විනාශවීම වළක්වා පැළ අවශ්‍යතාවය ඇති ප්‍රදේශවලට හැකි ඉක්මනින් ප්‍රවාහනය කර දීම මණ්ඩලයේ එකම ඉලක්කය විය. ඒ සඳහා සාමාන්‍ය ප්‍රවාහන වියදමට වඩා වැඩි වියදමක් වැය කිරීමට මණ්ඩලය සිදු වී ඇත. | නිසි අධ්‍යයනයකින් හා සැලැස්මකින් යුතුව ව්‍යාපෘති ආරම්භ කිරීම තුළින් අනවශ්‍ය වියදම් වළක්වා ගත යුතුය. |
| (ඉ) 2024 සැප්තැම්බර් 30 දින වන විට පොල් පැළ මිලියන 7.5 ව්‍යාපෘතිය වෙනුවෙන් නිෂ්පාදනය කරන ලද මාස 30 ඉක්මවූ බිම් හා බඳුන් පැළ 138,101 ක් කෘෂිකාර්මික වශයෙන් නිකුත් කළ නොහැකිවී ආදර්ශ පොල් උයන්වල අත්හැර තිබුණි. | පොල් පැළ මිලියන 7.5 ක වැනි විශාල ඉලක්කයක් එවකට පැවති රජයේ නිලධාරි විසින් ලබාදුන්නද රටේ පැවති අස්ථාවරභාවය මත එම පැළ බෙදාදීම සඳහා විධිමත් සැලැස්මක් මණ්ඩලය වෙත ලබාදී නොතිබුණි. එම නිසා මෙම පොල් පැළ මාස 10 ඉක්මවා ගොස් විශාල ලෙස වර්ධනය විය. කෙසේ වෙතත් ලබාදී හැකි උපරිම ආකාරයෙන් පැළ නිකුත් කළද 2024 සැප්තැම්බර් 30 වන විටත් ආදර්ශ පොල් උයන්වල මාස 30 ඉක්මවූ බිම් හා බඳුන් පැළ කෘෂිකාර්මික වශයෙන් නිකුත් කළ නොහැකි තත්ත්වයේ ඇත. | පොල් පැළ නිසි කාලයේදී ක්ෂේත්‍රයට නිකුත් කිරීමට හා සිටුවීමට කටයුතු කළ යුතුය. |
| (ඊ)සමෘද්ධිලාභී පවුල් සඳහා ක්‍රියාත්මක ජාතික ගෙවතු වගා සංවර්ධන වැඩසටහනට නිකුත් කිරීමට පොල් පැළ 500,000 ක් හලාවත වැවිලි සමාගමෙන් මිලදී ගැනීමට 2021 වර්ෂයේදී සැප්තැම්බර් හා නොවැම්බර් මාසවලදී රු.මිලියන 125 ක් එම සමාගමට ගෙවා තිබුණද 2022 නොවැම්බර් 25 දිනවන විට පොල් පැළ 375,000 ක් පමණක් මණ්ඩලයට ලබාදී තිබුණි. රු. මිලියන 31.25 ක් වටිනා පැළ 125,000 2024 වර්ෂයේ ඔක්තෝබර් මාසය වනතෙක් මණ්ඩලයට ලැබී නොතිබුණි. | පොල් වගාකිරීමේ මණ්ඩලයට හිඟ වූ මෙම පැළ ඇණවුම් 2021 වර්ෂයේදී හලාවත වැවිලි සමාගමට භාරදෙන ලදි. එහෙත් එම සමාගම පොල් වගාකිරීමේ මණ්ඩලය වෙත ලබාදුන් ඇතැම් පැළ පොල් පර්යේෂණ ආයතනයේ තාක්ෂණික උපදෙස් පත්‍රිකා $A_2$ අනුව ගැලපී නොතිබුණි. මුදල් ගෙවා ප්‍රමිතියෙන් තොර පැළ ලබාගෙන ඒවා වගාකරුවන්ට ලබාදීම සුදුසු නොවන හෙයින් එම නුසුදුසු පැළ මණ්ඩලය ප්‍රතික්ෂේප කරන ලදි. විශේෂයෙන් එම පැළ භාර ගැනීම සඳහා හලාවත වැවිලි සමාගමේ තවාන්වලට පැමිණි ප්‍රාදේශීය කළමනාකරුවන්ට මේ පිළිබඳව දන්වා ඇත. එමෙන්ම මණ්ඩලය මඟින් හලාවත වැවිලි සමාගමට දැන්වූ අතර එයට සුදුසු ප්‍රතිචාර නොලැබුණුවිට අදාළ මුදල් ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇත. | හලාවත වැවිලි සමාගම වෙත ලබාදුන් මුදලට ප්‍රමාණවත් පොල් පැළ ලබාගැනීමට හෝ ගෙවූ මුදල් ආපසු අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (උ)ආදර්ශ පොල් උයන් 12 හි 2023 වර්ෂයේ පොල් ගෙඩි නිෂ්පාදන භෞතික ඉලක්කය පොල් ගෙඩි 6,496,100 ක් වූ නමුත් භෞතික ප්‍රගතිය පොල් ගෙඩි 4,986,634 ක් විය. තවද ආදායම් ඉපයීමේ ඉලක්කය රු.398,016,196 ක් වූ නමුත් සත්‍ය ආදායම රු.299,415,290 ක් විය. ඒ අනුව පොල් නිෂ්පාදනය පිළිබඳ භෞතික ඉලක්කයට සාපේක්ෂව ප්‍රගතිය 23 % කින් හා ආදායම 25 % කින් අඩු වී තිබුණි. | මණ්ඩලීය ආදර්ශ පොල් උයන් සඳහා 2016 වර්ෂයෙන් පසු අවශ්‍ය පොහොර ප්‍රමාණයන් නොයෙදීම මෙසේ පුරෝකථනය කරන ලද අස්වැන්න නොලැබීමට හේතු වී ඇත. ජාතික පොල් අස්වැන්න ද 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ අඩුවීමක් නිරීක්ෂණය වේ. ආදර්ශ පොල් උයන්වල විශාල වශයෙන් පවතින දැවගස් හේතුවෙන් ද පොල් එලදාව අඩු වී ඇත. | මණ්ඩලය සතු ආදර්ශ පොල් උයන්වල පොල් නිෂ්පාදනය වැඩි කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඌ)පොල් වගාකිරීමේ මණ්ඩලයේ ආදර්ශ පොල් උයන් 12 හිම පොල් එලදාව 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී සියයට 13 සිට 37 දක්වා පරාසයකින් අඩු වී තිබුණි. | 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ සමස්ථයක් ලෙස ජාතික පොල් අස්වැන්නේ ද අඩුවීමක් නිරීක්ෂණය වේ. දීර්ඝ කාලීනව පොහොර නොයෙදීමේ බලපෑම වසරෙන් වසර ක්‍රමයෙන් වැඩිවීම හේතුවෙන් මෙලෙස පොල් අස්වැන්න අඩුවීමට ප්‍රධාන ලෙස බලපා ඇත. | මණ්ඩලය සතු පොල් උයන්වල පොල් එලදාව වැඩිකර ගැනීමට අවශ්‍ය පියවර යුතුය. |
| (එ)CCB/CRIU/CMG & ND/2022-01 දරන 2022 මැයි 05 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛයේ 1 වගන්තිය ප්‍රකාරව වැටෙන පොල් අස්වැන්න සියයට 10 ක් නොඉක්මවන ලෙස කටයුතු කළ යුතු වුවද මණ්ඩලය සතු පොල් උයන් 12 න් 8 ක 2023 වර්ෂයේ මුළු පොල් එලදාවෙන් වැටුනු පොල් ප්‍රතිශතය සියයට 11 ත් 25 ත් අතර විය. | වැටුණු පොල් ප්‍රතිශතය 10% නොඉක්මවන ලෙස කටයුතු කරන ලෙස ආදර්ශ පොල් උයන් වෙත දිගින් දිගටම උපදෙස් ලබා දී ඇතත් ආදර්ශ පොල් උයන්වල විශාල වශයෙන් මහ වගාවේ කෙකි මඟින් කැඩිය නොහැකි උස ගස් පවතින බැවින් පොල් කැඩීමේදී දුෂ්කරතා මතුව ඇති අතර, එමඟින් ද වැටුණු පොල් ප්‍රතිශතය වැඩිවී ඇත. පොල් පර්යේෂණ ආයතනය ඇතුලු සියලු වැවිලි සමාගම්වල වැටුණු පොල් ප්‍රතිශතය 20%ක පමණ අගයක පවත්වා ගන්නා අතර, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත වැටුණු පොල් ප්‍රතිශතය සම්බන්ධයෙන් නිකුත්කර ඇති 2022.05.05 දිනැති CCB/Criu/CMG &ND/2022-01 අංක දරන චක්‍රලේඛය ඉදිරියේදී සංශෝධනය කිරීමට කටයුතු කරනු ඇත. | පොල් කැඩීමේ දුෂ්කරතා මඟහරවා වැටුනු පොල් ප්‍රතිශතය අඩු කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඒ)මණ්ඩලය සතු ආදර්ශ පොල් උයන් 12න් මුන්දලම, කොහොඹාන. ගර්ට්ලන්ඩ්, රන්දෙණිය, පාසිකුඩා යන පොල් උයන් 05 හි කළු කුරුමිනි හානිය නිසා විනාශ වූ පොල් ගස් 194 ක් ද, මුන්දලම, බෝපිටිය, කොහොඹාන, ගර්ට්ලන්ඩ්, කොරෙයි, නාගන්සෝල, රන්දෙනිය, පලෙයි, පාසිකුඩා යන පොල් උයන් 09 හි රතුකුරුමිනි හානිය නිසා පොල් ගස් 276 ක් ද විනාශ වී තිබුණි. තවද පාසිකුඩා පොල් උයනෙහි | ආදර්ශ පොල් උයන් සඳහා බලපානු ලබන කෘමි හානි වලක්වා ගැනීම සඳහා අදාළ නිලධාරින් වෙත පුහුණු අවස්ථා ලබාදී ඇති අතර, විශේෂයෙන් ආදර්ශ පොල් උයන්වල දක්නට ලැබෙන රතු කුරුමිණි හා කළු කුරුමිණි හානි වලක්වා ගැනීමට පූර්ව ප්‍රතිකර්ම කිරීම සඳහා දැනුවත් කිරීම හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මකකර ඇත. සුදු මැස්සාගේ හානිය නිසා පොල් ගස්වල කොළවලට යම් හානියක් සිදුවී ඇති අතර, එම හානිය වලක්වා ගැනීම සඳහා අවශ්‍ය | වගාවන් විවිධ කෘමි උවදුරුවලින් ආරක්ෂා කර ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය. |

| | |
|---|---|
| මයිටා හානිය නිසා පොල් ගස් 1,100 ක් ද සුදුමැස්සා හානිය නිසා පොල් ගස් 320ක් ද විනාශ වී ඇති බව නිරීක්ෂණය විය. | ප්‍රතිකාර සිදුකර මේ වනවිට රෝග හානිය පාලනයකර ඇත. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය ප්‍රධාන තනතුරු 3 ක් වූ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පරිපාලන හා මානව සම්පත්) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය කළමනාකරණ) හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ව්‍යාප්ති හා සංවර්ධන) යන තනතුරු සමාලෝචිත වර්ෂයේ අවසානයට පුරප්පාඩුව පැවතුණි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය කළමනාකරණ) 2016 වර්ෂයේ සිට පිරවීමට කටයුතු කර නොතිබුණි. අනුමත තනතුරු (පොල් වගා කිරීමේ මණ්ඩලය සහ ආදර්ශ පොල් උයන්) 1,070 කින් තනතුරු 356 ක් පුරප්පාඩු වී පැවති අතර අවශ්‍යතාවය අනුව ප්‍රධාන පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කර ගැනීමට හෝ අනුමත තනතුරු සංඛ්‍යාව සංශෝධනය කරගැනීමට කටයුතු කර නොතිබුණි. තවද 2023 වර්ෂයේදී වැඩ බැලීම තනතුරු 77 ක් සඳහා රු.6,783,326 ක මුදලක් ගෙවා තිබුණි. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පරිපාලන හා මානව සම්පත්) තනතුරෙහි සේවය කළ නිලධාරියා උසස් වීම් ලබාගැනීම හේතුවෙන් 2023.07.06 දින සිට පුරප්පාඩු විය. එමෙන්ම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ව්‍යාප්ති හා සංවර්ධන) තනතුරෙහි සේවය කළ නිලධාරියා ද 2023.11.23 දින සිට සේවයෙන් ඉල්ලා අස්විය. මෙලෙස පුරප්පාඩු වූ තනතුරු සඳහා බඳවා ගැනිමේ පරිපාටිය ප්‍රකාරව විධිමත් පරිදි බඳවා ගැනීම් සිදුකිරීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත. එමෙන්ම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය කළමනාකරණ) තනතුරෙහි සේවය කළ නිලධාරියා 2016.05.03 දින සිට උසස්වීම් ලබාගැනීම හේතුවෙන් පුරප්පාඩු වූ අතර එම තනතුරු සඳහා බඳවා ගැනිමේ පරිපාටිය ප්‍රකාරව විධිමත් පරිදි බඳවා ගැනීම් සිදුකිරීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය 2024.04.30 ලැබී ඇත . | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු අනුමැතිය ලැබී ඇති ප්‍රධාන තනතුරු සඳහා නොපමාව බඳවා ගැනිමට කටයුතු කළ යුතුය. |